# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2021.06.21 |

## ජා.පා.මි.ද. මත පදනම් වූ උද්ධමනය 2021 මැයි මාසයේ දී ඉහළ යන ලදී

**මතුපිට උද්ධමනය**

වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය : 6.1%
වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 5.4%
මාසික වෙනස : 0.95%

**මූලික උද්ධමනය**

වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය : 4.2%
වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 4.4%
මාසික වෙනස : 0.8%

**ජා.පා.මි.ද. වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනසෙහි විචලනය**




**ජා.පා.මි.ද. මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2021 අප්‍රේල් මාසයේ පැවති සියයට 5.5හි සිට 2021 මැයි මාසයේ දී සියයට 6.1 දක්වා ඉහළ ගියේය. ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්හි සිදු වූ මාසික ඉහළ යෑම් මේ සඳහා හේතු විය. මේ අතර, ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2021 අප්‍රේල් මාසයේ දී පැවති සියයට 9.7හි සිට 2021 මැයි මාසයේ දී සියයට 10.3 දක්වා ඉහළ ගිය අතර, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2021 අප්‍රේල් මාසයේ පැවති සියයට 2.2හි සිට 2021 මැයි මාසයේ දී සියයට 2.5 දක්වා ඉහළ ගියේය.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජා.පා.මි. දර්ශකයෙහි වෙනස, 2021 අප්‍රේල් මාසයේ දී පැවති සියයට 5.3හි සිට 2021 මැයි මාසයේ දී සියයට 5.4 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.

2021 මැයි මාසයේ දී ජා.පා.මි. දර්ශකයෙහි මාසික වෙනස 0.95ක් ලෙස වාර්තා වූ අතර, ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්හි සිදු වූ ඉහළ යෑම් මේ සඳහා හේතු විය. ඒ අනුව, ආහාර කාණ්ඩයේ, ප්‍රධාන වශයෙන්, පොල්තෙල්, සහල් සහ නැවුම් මත්ස්‍ය මිල ගණන්වල ඉහළ යෑමක් දක්නට ලැබුණි. තවද, සෞඛ්‍ය (රසායනාගාර ගාස්තු, පෞද්ගලික රෝහල්/ සාත්තු නිවාස ගාස්තු), නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන (එල්.පී.ගෑස්) සහ ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ සහ ගෘහ ඒකක නඩත්තු (නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය) යන උප කාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම් හේතුවෙන්, ආහාර නොවන කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්හි ඉහළ යෑමක් 2021 මැයි මාසයේ දී වාර්තා විය.

තවද, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය 2021 අප්‍රේල් මාසයේ දී පැවති සියයට 4.1හි සිට 2021 මැයි මාසයේ දී සියයට 4.2 දක්වා සුළු වශයෙන් ඉහළ ගිය අතර, වාර්ෂික සාමාන්‍ය මූලික 2021 මැයි මාසයේ දී සියයට 4.4හි නොවෙනස්ව පැවතුණි.

[1] ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබයි.

## දත්ත ඇමුණුම

### සංඛ්‍යා සටහන 1 : ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම

**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) |
| 2019 | ජනවාරි | 127.3 | 130.2 | 0.2 | 2.0 | 1.2 | 5.1 | 1.8 | 2.7 |
| | පෙබරවාරි | 126.7 | 131.3 | -0.5 | 0.8 | 2.4 | 5.5 | 1.7 | 3.0 |
| | මාර්තු | 126.4 | 131.8 | -0.2 | 0.4 | 2.9 | 5.8 | 1.7 | 3.3 |
| | අප්‍රේල් | 127.3 | 132.6 | 0.7 | 0.6 | 3.6 | 6.3 | 1.9 | 3.7 |
| | මැයි | 128.7 | 133.0 | 1.1 | 0.3 | 3.5 | 6.3 | 2.0 | 4.0 |
| | ජුනි | 129.2 | 133.0 | 0.4 | 0.0 | 2.1 | 6.1 | 2.0 | 4.4 |
| | ජූලි | 129.4 | 133.4 | 0.2 | 0.3 | 2.2 | 6.1 | 1.9 | 4.7 |
| | අගෝස්තු | 129.7 | 133.7 | 0.2 | 0.2 | 3.4 | 5.9 | 2.0 | 5.0 |
| | සැප්තැම්බර් | 130.6 | 134.0 | 0.7 | 0.2 | 5.0 | 5.6 | 2.3 | 5.2 |
| | ඔක්තෝබර් | 131.9 | 134.4 | 1.0 | 0.3 | 5.6 | 5.6 | 2.8 | 5.4 |
| | නොවැම්බර් | 132.9 | 134.6 | 0.8 | 0.1 | 4.1 | 5.5 | 3.0 | 5.6 |
| | දෙසැම්බර් | 135.0 | 134.2 | 1.6 | -0.3 | 6.2 | 5.2 | 3.5 | 5.7 |
| 2020 | ජනවාරි | 137.0 | 135.3 | 1.5 | 0.8 | 7.6 | 3.9 | 4.1 | 5.6 |
| | පෙබරවාරි | 137.0 | 135.8 | 0.0 | 0.4 | 8.1 | 3.4 | 4.5 | 5.5 |
| | මාර්තු | 135.2 | 136.0 | -1.3 | 0.1 | 7.0 | 3.2 | 4.9 | 5.2 |
| | අප්‍රේල් | 134.8 | 136.9 | -0.3 | 0.7 | 5.9 | 3.2 | 5.1 | 5.0 |
| | මැයි | 135.4 | 137.9 | 0.4 | 0.7 | 5.2 | 3.7 | 5.2 | 4.8 |
| | ජුනි | 137.3 | 138.9 | 1.4 | 0.7 | 6.3 | 4.4 | 5.6 | 4.6 |
| | ජූලි | 137.3 | 139.4 | 0.0 | 0.4 | 6.1 | 4.5 | 5.9 | 4.5 |
| | අගෝස්තු | 137.8 | 139.9 | 0.4 | 0.4 | 6.2 | 4.6 | 6.1 | 4.4 |
| | සැප්තැම්බර් | 138.9 | 140.4 | 0.8 | 0.4 | 6.4 | 4.8 | 6.2 | 4.3 |
| | ඔක්තෝබර් | 139.1 | 140.5 | 0.1 | 0.1 | 5.5 | 4.5 | 6.2 | 4.2 |
| | නොවැම්බර් | 139.8 | 140.6 | 0.5 | 0.1 | 5.2 | 4.5 | 6.3 | 4.2 |
| | දෙසැම්බර් | 141.2 | 140.5 | 1.0 | -0.1 | 4.6 | 4.7 | 6.2 | 4.1 |
| 2021 | ජනවාරි | 142.1 | 141.0 | 0.6 | 0.4 | 3.7 | 4.2 | 5.8 | 4.2 |
| | පෙබරවාරි | 142.8 | 141.3 | 0.5 | 0.2 | 4.2 | 4.1 | 5.5 | 4.2 |
| | මාර්තු | 142.1 | 141.8 | -0.5 | 0.4 | 5.1 | 4.3 | 5.3 | 4.3 |
| | අප්‍රේල් | 142.2 | 142.5 | 0.1 | 0.5 | 5.5 | 4.1 | 5.3 | 4.4 |
| | මැයි | 143.6 | 143.7 | 1.0 | 0.8 | 6.1 | 4.2 | 5.4 | 4.4 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව